ඇමෙරිකා - ශ්‍රී ලංකා ගුවන් හමුදාවන් එක්ව සංවිධානය කරනු ලබන " පැසිෆික් එයාර් ලිෆ්ට් 2011" එකාබද්ධ පුහුණුවක් රත්මලාන ගුවන් තොටුපළේදී පැවැත්වේ.

මෙම වැඩ සටහන ඇමෙරිකා එක්සත් ජනපද ශාන්තිකර ගුවන් හමුදාව විසින් ආසියා-ශාන්තිකර කලාපයේ රාජ්‍යයන් සඳහා ද්වී වාර්ෂිකව පවත්වන්නකි. 1997 වර්ෂයේ අරඹනලද මෙම අභ්‍යාස මාලාවේ අට වැනි වැඩසටහන මෙම වසරේ පැවැත්වේ. 2011 අභ්‍යාසයේදී වැඩි අවධානයක් යොමු කරනු ලබන්නේ මානුෂීය ආධාර හෝ ආපදා සහන ගුවනින් ලබා දීම සඳහා කලාපයේ විවිධ රාජ්‍ය හමුදාවන් අන්‍යෝන්‍ය සහයෝගයෙන් කටයුතු කිරීම මතය.

ස්වාභාවික විපත් වලදී ගුවනින් ආධාර සැපයීම පිලිබඳ ක්ෂේත්‍ර වැඩ සටහන්, විද්වත් දේශන හා වැඩමුළු මෙම අභ්‍යාසයේ වැදගත් අංග වේ. ඔස්ට්‍රේලියාව, බංගලාදේශය, කාම්බෝජය, කැනඩාව, ඉන්දියාව, ඉන්දුනීසියාව, ජපානය, ලාඕසය, මාල දිවයින, මැලේසියාව, මොන්ගෝලියාව, නේපාලය, පැපුවා නිවුගිනීයාව, පිලිපීනය, ශ්‍රී ලංකාව, තායිලන්තය, ටොන්ගාව, ඇමෙරිකා එක්සත් ජනපදය හා වියට්නාමය යන රටවල් මෙම අභ්‍යාසයේ යෙදවීමට නියමිතය. (බෘනායි රාජ්‍යය සිය සහභාගීත්වය තහවුරු කර නො මැත.)

ජපානයේ රඳවා ඇති ඇමෙරිකානු ගුවන් හමුදාවට අයත් c 130 ගුවන් යානා තුනක් සමග මැලේසියානු රාජකීය ගුවන් හමුදාවේ, ඔස්ට්‍රේලියානු ගුවන් හමුදාවේ හා ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ c 130 ගුවන් යානාව බැගින් මෙහි ක්ෂේත්‍ර පුහුණුවේ යෙදෙනු ඇත.